**ශීර්ෂය - 5 අමාත්‍ය මණ්ඩල කාර්යාලය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මතය**

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුලත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 26 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුනි 15 දින ප්‍රධාන ගණන් දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුලත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි. .
- හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුලත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදි.

මාගේ විගණනය තුළ දී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 සැලසුම් කිරීම

#### 2.1.1 ප්‍රසම්පාදන සැලැස්ම

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 2/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ දැක්වෙන මාර්ගෝපදේශ අංක 13 හි 04 ඡේදයට අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සවිස්තර ප්‍රසම්පාදන සැලැස්මක් ඉදිරිපත් කර නොතිබුණ අතර ඉදිරිපත් කරන ලද ප්‍රසම්පාදන සැලැස්මේ ප්‍රගතිය විගණනය සඳහා ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සැලැස්මේ ඵලදායීතාවය ඇගයීමට විගණනයට නොහැකි විය. | පෙර වර්ෂවල ඉදිරිපත් කරන ලද ආකෘතීන් අනුව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සහ ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කරන ලදි . | අදාල චක්‍රලේඛ මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර විගණනයට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය. |
| (ආ ) | සමාලෝචිත වර්ෂය තුල ඇස්තමේන්තුගත රු. 41,750,000 ක් වූ මුළු ප්‍රාග්ධන වියදමින් රු. 21,837,350 ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර එය ඇස්තමේන්තුගත මුළු ප්‍රතිපාදනයෙන් සියයට 52.3ක් පමණක් විය. එසේ වුවද, කාර්යසාධන වාර්තාවේ භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේ අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් ලෙස තත්‍ය නිමැවුම සියයට 80 ක් ලෙස පෙන්වා දී තිබුණි. | භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනයේ අපේක්ෂිත නිමවුම සියයට 52.3 ක් වන අතර වැරදීමකින් කාර්යසාධන වාර්තාවේ සියයට 80 ක් ලෙස සටහන් වී ඇත. | නිවැරදිව සංඛ්‍යාවන් වාර්තාවල ඇතුලත් කිරීමට කටයුතු කළ යුතු ය. |

## 2.2 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍ය මණ්ඩලයේ තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරලීම පිණිස අනුකාරක සභා 04 ක් පැවති අතර ඉන් අනුකාරක සභා 02 ක් වර්ෂය තුළ අමාත්‍ය මණ්ඩල තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කරලීමට අදාල ක්ෂේත්‍ර හෝ කරුණු සම්බන්ධයෙන් සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීමට කටයුතු කලේද යන්න තහවුරු කර ගැනීමට එම අනු කමිටු සමාලෝචිත වර්ෂය තුළ රැස්වූ වාර සංඛ්‍යාව විගණනයට ඉදිරිපත් කර නොතිබීමෙන් සනාථ කර ගැනීමට නොහැකි විය. | ව්‍යවස්ථා කටයුතු පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව අධිකරණ අමාත්‍යාංශය විසින් ද ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාව වෙළඳ අමාත්‍යාංශය විසින් ද සංවිධානය කර පවත්වනු ලබන අතර එම අනුකාරක සභා රැස්වූ වාර ගණන පිළිබඳ තොරතුරු ද එම අමාත්‍යාංශ වෙතින් ලබා ගෙන ඉදිරියේ දී වාර්ෂික වාර්තාවට ඇතුලත් කිරීමට සටහන් කර ගතිමි. | විගණනයට තොරතුරු ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

## 2.3 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 දරන මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛයේ 11.1 ඡේදයේ අනු අංක 06 ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ වාර්තාව විගණකාධිපති වෙත යොමු කර නොතිබුණි. | භාණ්ඩ සමීක්ෂණය පැවැත්වීම සඳහා 2021.12.15 දිනට පෙර නියමිත පරිදි භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කරන ලද නමුත් කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් අවම සේවක සංඛ්‍යාවකින් කාර්යාලයේ කටයුතු පවත්වා ගත් අතර, නිලධාරීන් කොවිඩ් වසංගතය ආසාදනය වීම සහ කාර්යාල කටයුතු ලොයිඩ්ස් ගොඩනැගිල්ල වෙත ගෙන යෑම හේතුවෙන් අපේක්ෂිත දිනයන්හි දී අදාල සමීක්ෂණ කටයුතු අවසන් කිරීමට නොහැකි විය. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු අප්‍රමාදව සිදුකර වාර්තා විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

**3.** **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 ජනවාරි 24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 2/2018 හි ඇමුණුම 2 ආකෘතිය පදනම් කර ගෙන නිලධාරීන් සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර නොතිබුණි. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් රාජ්‍ය නිලධාරීන් කාර්යාලය වෙත කැඳවීම සීමා කිරීම හා ඔවුන්ගේ පදිංචියට ආසන්න තැපැල් කාර්යාල වෙත තාවකාලිකව අනුයුක්ත කර තිබීමද , සුදුසු පුහුණු වැඩසටහන් සඳහා බාහිර පුහුණු ආයතනවලින් ලැබුණු ඇරයුම් සංඛ්‍යාව සීමා සහිතවීම හේතුවෙන් මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීමට හැකියාවක් නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්මක් සකස් කර ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | ඉහත චක්‍රලේඛයට අනුව, කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ලබා දියයුතු වුව ද, සමස්ථ කාර්යය මණ්ඩලයේ නිලධාරීන් 82 දෙදෙනෙකුගෙන් නිලධාරීන් තිදෙනෙකුට පමණක් පිළිවෙලින් පැය 24 ක් , පැය 8ක් හා පැය 24 බැගින් වර්ෂය තුළ පුහුණුවීම් ලබා දී තිබුණි.ඒ අනුව සේවක පුහුණුවීම්වල ප්‍රගතිය සියයට 3.6 ක් විය. | කොවිඩ් -19 තත්ත්වය හේතුවෙන් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2020 අනුව රාජ්‍ය නිලධාරීන් කාර්යාලය වෙත කැඳවීම සීමා කර තිබුණු බැවින් හා සැලසුම් කර තිබූ පුහුණු වැඩසටහන් කොවිඩ් -19 තත්ත්වය හේතුවෙන් අවලංගු කර දමන ලද හෙයින් එම චක්‍රලේඛයේ විධි විධාන අනුව කටයුතු කිරීමට හැකියාවක් නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව සෑම නිලධාරියෙක් සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් සැලසෙන පරිදි සැලසුම් සකස් කළ යුතුය. |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 121 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව ස්ථිර හා කොන්ත්‍රාත් සේවක සංඛ්‍යාව පිළිවෙලින් 79 ක් හා 03 ක් වූ අතර පුරප්පාඩු 39 ක් පැවතුණි. | සීමිත ඉඩ කඩ පැවතීම හේතුවෙන් ප්‍රමාණවත් කාර්යාලයීය ඉඩ පහසුකම් සැපයීම ගැටලු සහගතව පැවති අතර වර්තමානයේ කාර්ය මණ්ඩලයට එහි ප්‍රමාණවත් ඉඩ පහසුකම් පවතින බැවින් පවතින පුරප්පාඩු සඳහා සුදුසු නිලධාරීන් හඳුනා ගෙන එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ඉදිරියේ දී පියවර ගැනීමට සැලසුම් කර පවති. | පුරප්පාඩු තනතුරු පිරවීමට කටයුතු කළ යුතුය. |